# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා ලියාපදිංචි කිරීම - 2022

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා 2022 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2022 ජනවාරි මස 31 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### අධ්‍යාපන සුදුසුකම්

**(අ) දේශීය අයදුම්කරුවන් සඳහා**

(01) ප්‍රාචීන ප්‍රාරම්භ හෝ ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත්වීම

**හෝ**

(02) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී බෞද්ධ විෂයයක් සහිතව යටත් පිරිසෙයින් විෂයයන් තුනකින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබිය යුතුය)

**හෝ**

(03) පාලි, සංස්කෘත, සිංහල, බෞද්ධ සංස්කෘතිය යන විෂයයන්ගෙන් එකක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබිය යුතුය)

**හෝ**

(04) බෞද්ධ ධර්මාචාර්ය හෝ දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා විභාගය සමත්වීම සමග අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් යටත් පිරිසෙයින් විෂයයන් තුනකින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබිය යුතුය)

**හෝ**

(05) පිළිගත් විශ්වවිද්‍යාලයක (දේශීය හෝ විදේශීය) උපාධියක් හෝ ඊට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් ලබා තිබීම

**හෝ**

(06) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බුද්ධ ධර්ම, පාලි, සංස්කෘත හෝ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත්වීම

**හෝ**

(07) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්වීම හා ඉන් පසු **වසර දෙකක** දහම් පාසල් ගුරු සේවය

**හෝ**

(08) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සමාන යැයි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ විෂයයක් සමග වෙනත් කවර හෝ පරීක්ෂණයක් සමත්ව තිබීම.

**(ආ) විදේශීය අයදුම්කරුවන් සඳහා**

(01) දේශීය අයදුම්කරුවන් සඳහා නියමිත ඉහත 01-08 දක්වා සඳහන් සුදුසුකම්වලින් එකක්

**හෝ**

(02) ලන්ඩන් (උසස් පෙළ) විභාගය හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සමාන යැයි විශ්වවිද්‍යාලයීය සනාතන සභාවට පිළිගත හැකි වෙනත් කිසියම් සුදුසුකමක් ලබා තිබීම.

- සියලු අයදුම්කරුවන් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය ගණිතය හා සිංහල ඇතුළු විෂයයන් හයකින් සම්මාන තුනක් වත් සහිතව සමත්ව තිබිය යුතු ය.

### අධ්‍යයන විෂයයන්

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා මෙම විශ්වවිද්‍යාලයේ අනුමත විෂයයන් පහත සඳහන් වේ.

පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, පුරාවිද්‍යාව, සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය.

### අයදුම්පත් ලබාගන්නා ආකාරය

විස්තර හා අයදුම්පත් තැපැල් මගින් ලබා ගන්නේ නම්, දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි රු.750/=ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග 10X8 ප්‍රමාණයේ රු. 55.00 ක මුද්දර ඇල වූ ලිපිනය ලියන ලද ලියුම් කවරයක් අයදුම්පත් ඉල්ලීම් ලිපියක් සමග **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.** යන ලිපිනයට එවිය යුතු ය.

නැතහොත් අයදුම්පත පැමිණ ලබා ගන්නේ නම් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා උක්ත ලිපිනයේ පිහිටි පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ සරප් වෙත ගාස්තු ගෙවා විස්තර හා අයදුම්පත් ලබාගත හැකි ය.

එසේත් නැතහොත් විස්තර හා අයදුම්පත www.bpu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැකිය.

**සැ.යු.**

- අයදුම්පත් හා විස්තර වෙබ් අඩවිය ඔස්සේ හා තැපැල් මගින් ලබාගන්නේ නම් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි රු.750/=ක් ගෙවා ලබාගන්නා ලද ලදුපත සමග එම අයදුම්පත ඉදිරිපත් කළ යුතු වේ. බැංකුවට ගෙවීම් සිදු කරන ගෙවීම් පතෙහි ඔබගේ නම ඉදිරියෙන් B.A. ලෙස සංකේත අංකය යෙදීම අනිවාර්ය වේ.
- ප්‍රමාණය ඉක්මවා ශිෂ්‍යයන් අයදුම් කර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලය විසින් සකස් කරනු ලබන නිර්ණායකවලට අනුව තෝරා ගැනීම් සිදු කරන අතර, ඉහත (1), (2), (3) සහ (4) යන සුදුසුකම් සඳහා මූලිකත්වය ලබා දී අනුපිළිවෙළින් ශිෂ්‍ය බඳවා ගැනීම සිදු කරනු ලැබේ. තෝරා ගනු ලබන ශිෂ්‍ය ප්‍රමාණය විශ්වවිද්‍යාලයේ සම්පත් මත තීරණය වන බැවින් විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් නිකුත් කිරීමේ අවසාන දිනය 2022.01.28 වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2022.01.31 වේ. එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07"** යන ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**විමසීම් : දුරකථන අංක : 011-2580609 / 011-2502944**

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

**2021 දෙසැම්බර් 09**